**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**
**කොළඹ**
*******

**<u>පුවත්පත් නිවේදනය</u>**

**ඉන්දියාවේ නිෂ්පාදිත එන්නත් සමඟින් COVAX ගෝලීය කොවිඩ් එන්නත් සැපයුම අරඹයි**

ඉන්දියාවේ නිෂ්පාදිත ඔක්ස්ෆර්ඩ්-ඇස්ට්‍රාසෙනිකා එන්නත් මාත්‍රා 600,000ක් ඝානා රාජ්‍යය වෙත සපයමින් 2021 පෙබරවාරි 24 වන දින COVAX වැඩසටහන සිය ගෝලීය කොවිඩ් එන්නත් සැපයුම ආරම්භ කළේය. විවිධ අඩු සහ මධ්‍ය ආදායම්ලාභී රටවල් සඳහා ක්‍රියාත්මක COVAX පහසුකම යටතේ සැලසුම් කර ඇති පළමු එන්නත් තොගය මෙයයි.

2. ඉන්දියාව වසංගතයට එරෙහිව ගෝලීය සටනේ පෙරමුණෙහි සිටින අතර සාමූහික ප්‍රවේශයකින් වසංගතයට එරෙහිව කටයුතු කරයි. ඉන්දියාවේ එන්නත් නිෂ්පාදනය සහ සැපයුම් ධාරිතාවය කොවිඩ්-19 වසංගතයට එරෙහිව සමස්ත මනුෂ්‍යත්වයටම සහය වීම සඳහා උපයෝගී කර ගැනෙනු ඇතැයි 2020 සැප්තැම්බර් 26 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය අමතමින් අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ප්‍රකාශ කළේය. මෙම දැක්ම මත පදනම්ව "ලෝකයේ ඔසුසල" වන ඉන්දියාව ශ්‍රී ලංකාව ඇතුළු ලොව පුරා රටවලට එන්නත් මාත්‍රා මිලියන ගණනක් ප්‍රදාන වශයෙන් සපයා ඇත. විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා 2021 පෙරබරවාරි 17 වන දින පැවති එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල රැස්වීමකදී එන්නත්කරණ වැඩපිළිවෙළට සහය වීම සඳහා ඉන්දියාවේ ප්‍රවේශය අවධාරණය කළ අතර "එන්නත් ජාතිකකරණය" ට එරෙහිව අදහස් දක්වමින් "එන්නත් ජාත්‍යන්තරීකරණය" කළ යුතු බව ප්‍රකාශ කළේය.

3. සමස්ත මනුෂ්‍ය වර්ගයාගේම සෞඛ්‍යය සහ සුබ සිද්ධිය වෙනුවෙන් ඉන්දියාවේ ශක්‍යතාවයන්හි දායකත්වය ලබා දීමට ඉන්දියාව දක්වන කැපවීම එන්නත් සැපයීමට පමණක් සීමා වී නැත. ඉන්දියාව තීරණාත්මක ඖෂධ, ශ්වසන ආධාරක යන්ත්‍ර සහ පෞද්ගලික ආරක්ෂක කට්ටල රටවල් 150කට අධික ප්‍රමාණයකට ලබා දී ඇති අතර එයින් රටවල් 80කට පමණ ප්‍රදාන වශයෙන් ලබා දී ඇත.

4. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව කොවිඩ්-19 වසංගත සමය තුළ සමීප සහයෝගීතාවයකින් කටයුතු කර ඇත. කොවිඩ්-19 වසංගත තත්වය තුළ ඉන්දියාව ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය වෛද්‍ය සැපයුම් ටොන් 26ක් ප්‍රදාන වශයෙන් ලබා දී තිබේ. මෙයට අමතරව ශ්‍රී ලංකාවට මෙතෙක් කොවිඩ්-19 එන්නත් ලබා දුන් එකම රට ද ඉන්දියාව වේ. කොවිඩ් එන්නත් මාත්‍රා 500,000ක දෙවන තොගය 2021 පෙබරවාරි 25 වන දින ශ්‍රී ලංකාවට ළඟා විය. පළමු එන්නත් මාත්‍රා 500,000ක තොගය ඉන්දියාව විසින් ප්‍රදානයක් වශයෙන් ශ්‍රී ලංකාවට ලබා දෙන ලදී.

* * *

**කොළඹ**
**2021 පෙබරවාරි 25**